රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 28/2018

මගේ අංකය : EST-1/MISCL/06/0032(I)
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2018.12.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2019 වසර - රාජකාරි කටයුතු ඇරඹීම

අතිගරු ජනාධිපතිතුමන් විසින්, එළඹෙන 2019 වර්ෂය තුළ මතින් තොර, පරිසර හිතකාමී, ගුණ ගරුක මිනිසුන්ගෙන් පිරි ආර්ථික වශයෙන් ශක්තිමත් ජනතාවක් බිහි කිරීමේ වැඩපිළිවෙළ ශක්තිමත් කිරීමේ වැදගත්කම අවධාරණය කර ඇත. ඒ අනුව මතින් තොර, පරිසර හිතකාමී, ගුණ ගරුක මිනිසුන්ගෙන් පිරි ආර්ථික වශයෙන් ශක්තිමත් ජනතාවක් බිහි කිරීම ප්‍රමුඛ අරමුණ කරගනිමින් හා සියලු ම රාජ්‍ය සේවකයන් තුළ කැපවීමෙන් වැඩ කිරීමේ ආකල්පමය වෙනසක් ඇති කිරීමේ අවශ්‍යතාව පිළිබඳව අවධානය යොමු කරමින් එම වර්ෂයේ රාජකාරි අරඹන පළමු දිනය වන 2019 ජනවාරි මස 01 වන අඟහරුවාදා සියලු ම රාජ්‍ය සේවකයන්ගේ සහභාගීත්වයෙන් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට මෙයින් උපදෙස් දෙමි.

02. එහි ප්‍රධාන නිල උත්සවය ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් එදින පෙ.ව.9.00ට ජනාධිපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වේ. ඊට සමගාමීව එදින එම වේලාවට ම පහත දැක්වෙන වැඩසටහන ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම නියෝජනය කරන සියලු ම රාජ්‍ය ආයතන සහ කාර්යාලවල පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන වැඩපිළිවෙළ යොදා ගත යුතු වේ.

I. සියලු ම කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉදිරිපිට දී ආයතනයෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානියා ජාතික ධජය එසවීම. (සියලු ම කාර්ය මණ්ඩල සාමාජිකයන් එක් තැනකට ඒකරාශී කරවීමට බාධා පමුණුවන ඉඩකඩ පිළිබඳ යම් ප්‍රශ්නයක් වෙතොත් සෑම සාමාජිකයෙකුගේ ම සහභාගිත්වය සහතික කෙරෙන පරිදි සුදුසු විකල්ප වැඩපිළිවෙළක් යොදා ගත හැකි ය.)

II. ජාතික ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීම.

III. රණවිරුවන් ඇතුළුව දේශය වෙනුවෙන් දිවි කැප කළ සියලු දෙනා සැමරීම සඳහා විනාඩි 02ක නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීම.

IV. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් තම තමන්ට පහසු භාෂාවකින් (මේ සමඟ එවා ඇති) රාජ්‍ය සේවා ප්‍රතිඥාව/දිවුරුම හඬ නගා කියවීම.

V. ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධනයක් ළඟා කරගැනීමේ වැඩපිළිවෙළ සඳහා කාර්ය මණ්ඩලයේ සෑම දෙනාගේ ම දායකත්වය අවංකව, අප්‍රමාදව සහ දැඩි කැපවීමකින් යුතුව ලබා දීමේ අවශ්‍යතාව තේමා කර ගත් කෙටි දේශනයක් ආයතනයේ ප්‍රධානියා විසින් පැවැත්වීම.

03. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත් - ගරු පළාත් ආණ්ඩුකාරවරුන්

## රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව / දිවුරුම

දෙදහස් දහනවය වර්ෂයේ රාජකාරි අරඹන පළමු වැනි දිනය වන අද දින,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ලක් වැසි ජනතා අපේක්ෂාවන් යථාර්ථයක් බවට පත් කරන

නව වසරක සමාරම්භය සනිටුහන් කරයි.

අදින් ඇරඹෙන නව වසරේ

එකම රටක්, එකම දැයක් තුළ එක කොඩියක සෙවණේ

එක්සත්ව හා එක්සිත්ව විකසිත වන මාතෘ භූමිය

සංවර්ධනය කිරීමේ දැවැන්ත අභියෝගය ජය ගැනීම සඳහාත්

සැමට ප්‍රතිලාභ හිමි වන වේගවත් සංවර්ධනයක් තුළින්

2019 වර්ෂයේ දී මතින් තොර, පරිසර හිතකාමී, ගුණ ගරුක

මිනිසුන්ගෙන් පිරි ආර්ථික වශයෙන් ශක්තිමත් ජනතාවක් බිහි කිරීම සඳහාත්

ශ්‍රී ලාංකික ජනතාවට

සුරක්ෂිත අනාගතයක් නිර්මාණය කිරීම සඳහාත්

මහජන මුදලින් වැටුප් ලබන රාජ්‍ය සේවකයෙක් වන මම,

රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා

මා වෙත පැවරෙන්නා වූ කාර්යභාරය

කාර්යක්ෂමව,

සඵලදායීව,

තිර අදිටනින් යුතුව,

උපරිම කැපවීමෙන්,

අවංකභාවයෙන්,

මහජනතාවට පක්ෂපාතීව,

සපුරා ඉටු කරන බවට ප්‍රතිඥා දෙමි / දිව්රුම් දෙමි.